**ශීර්ෂය 285 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත **2023** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් **2023** දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) බැරකම් ශේෂ**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ බැඳීම් හා බැරකම් පිළිබඳ සටහන (iv) අනුව 2023 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් ශේෂය රු.163,688,502 ක වුවද, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් (SA 92) අනුව එම ශේෂය රු. 93,333,499 ක් විය. | පිළිගනිමි. | භාණ්ඩාගාර මුද්‍රිත සටහනක් සමඟ සැසඳිය යුතුය. |

**(ආ) වාණිජ අත්තිකාරම් ගිණුම්**

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(i)** | ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂවල අය වී තිබුණු රු.136,010 ක ණයගැති ශේෂයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිකවැරටිය නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ ණයගැති ශේෂය තුල ඇතුළත්ව තිබුණි. | 2024 ගිණුම් පිළියෙළ කිරීමේදී නිවැරදි කරන බව | නිවැරදි ණයගැති ශේෂය ගිණුම්ගත කළ යුතුය. |

| (ii) | වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ඒ දක්වා ක්ෂය කර තිබූ සමුච්චිත ක්ෂය ප්‍රමාණය ක්ෂය සංචිත ගිණුමෙන් ඉවත් කර තිබුනද එම ප්‍රත්‍යාගණනය කර තිබූ වත්කම් සමාලෝචිත වර්ෂය තුල ඉවත් කිරීමේදී (හුවමාරු කිරීමද ඇතුළුව) එම වත්කම් ප්‍රත්‍යාගණනය කර තිබූ බව නොසළකා ඒ දක්වා වූ සමුච්චිත ක්ෂය රු. **10,**694,231ක් නැවත ක්ෂය සංචිත අරමුදලින් ඉවත් කර තිබුණි. | 2024 ගිණුම් පිළියෙළ කිරීමේදී නිවැරදි කරන බව | ක්ෂය ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් පාලන ක්‍රමය ඇගයීමට ලක් කර නිවැරදිව ගිණුම්ගත කළ යුතුය**.** |
|---|---|---|---|

**(ඇ) ආදායම් ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හෙල බොජුන්හල් ව්‍යවසායකයින්ගෙන් ලැබිය යුතු බිම් කුලී රු.31,500 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර බොජුන්හල් ව්‍යවසායකයින් 07 දෙනෙකුගෙන් වර්ෂ 1 ක සිට වර්ෂ 4 ක් දක්වා කාලයක් වෙනුවෙන් ලැබිය යුතු බිම් කුලිය හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 ජනවාරි 12 දිනට පෙර හිඟ ආදායම් පිළිබඳ වාර්ථාවක් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ බව. | සියළුම ලැබිය යුතු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**(ඈ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ හා සංවර්ධන වැය විෂයයට හර කර මිලට ගෙන තිබූ රු. 4,053,541 ක යන්ත්‍ර සූත්‍ර හා උපකරණ හා රු.10,305,475 ක ගොඩනැගිලි සහ ඉදිකිරීම් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි**.** | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අත්පත් කරගත් සියළු වත්කම් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතුය. |
| **(ii)** | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට දෙපාර්තමේන්තු පොත් අනුව දේපල පිරියත හා උපකරණවල එකතුව රු.15,088,842,880 ක් ලෙස තොරතුරු ඉදිරිපත් කර තිබුණ ද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ඒසීඒ 06) හි එය රු.29,340,698,361ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් රු.14,251,855,481 කින් නොසැසඳුනි. | තාක්ෂණික ගැටළුවක් මත සිගාස් යටතේ ගිණුම්ගත කර ඇති ශේෂ හා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යොමු කළ ලේඛන අතර වෙනසක් දක්නට ලැබේ. | ගිණුම් ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| **(iii)** | ඉදිරිපත් කර ඇති ලේඛන අනුව ගොඩනැගිලි සහ ඉදිකිරීම් ඒකක 1235 ක්, ප්‍රවාහන උපකරණ 28 ක් සහ ඉඩම් කොටස් 371 ක් වශයෙන් වූ මූල්‍ය නොවන වත්කම් 1634 ක් සමාලෝචිත වර්ෂයේ | එම වත්කම් තක්සේරු කර වාර්තා කරන ලෙස උප ඒකක දැනුවත් කර ඇති බව. | වත්කම් තක්සේරු කර නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දින වන විටත් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | | |
| **(iv)** | සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණු රු. 12,704,753 ක ආදායම මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇතත්, එම වත්කම් බැහැර කිරීමේ වූ ලාභය හෝ පාඩුව මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කර නොතිබූ අතර අපහරණය කරන ලද ප්‍රාග්ධන වත්කම්වල පිරිවැය හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කිරීමට ද කටයුතු කර නොතිබුණි. | මේ සඳහා ක්‍රමවේදයක් සකස් කර අදාළ ගැලපීම් සිදු කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**(ඉ)** **අත්තිකාරම් ගිණුම් ශේෂ**

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(i)** | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ (ACA-F) හා භාණ්ඩාගාර සටහන්වල අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් රු.8,556,948 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | ඔක්තෝබර් මාසයේ හර ලෙස සටහන්ව තිබූ අගයන් භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල බැර ලෙස සටහන් වී තිබීම මේ සඳහා හේතු වී ඇති බව. | ගිණුම් ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| **(ii)** | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පැවති දැනට ඇවර කර ඇති වානිජ අත්තිකාරම් ගිණුම් 02 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.40,899,996 ක ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 සීමා නොපිළිපැදීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 503(2) ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් කෘෂිකාර්මික ගොවිපල් නඩත්තු හා බීජ අලෙවි අත්තිකාරම් ගිණුමට සමාලෝචිත වර්ෂයේදී හරස් සටහන් මගින් සිදුකර තිබූ රු.11,989,882 ක අවකරණ වියදමක් වශයෙන් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ගොවිපල් නඩත්තු හා බීජ අලෙවි අත්තිකාරම් ගිණුමේ රු. 950,000,000 ක් වූ හර ශේෂයන්ගේ උපරිම සීමාව රු.11,859,129 කින් ඉක්මවා ගොස් තිබුණි. | සීමා සංශෝධනයට අවශය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි 503(2) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/ 2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 03 ඡේදය අනුව එක් එක් වැය විෂයයන් වෙනුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැරකම් හා බැදීම් වලට එළඹිය නොහැකි වුවද 11 වැය විෂයය ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.1,270,445 ක බැරකම් වලට එළඹ තිබුණි. | ඒ පිළිබඳව සියළු අධ්‍යක්ෂවරු දැනුවත් කළ බව. | චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 224 වගන්තිය | - | දෙපාර්තමේන්තුවේ ඒකක 10 කට අයත් හෙක්ටයාර 1954 ක ඉඩම්වල අයිතිය පවරා ගෙන නොතිබුණි | ඉඩම් පැවරීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 3.1 හා 5.3 වගන්ති | 1918,128 | අළුත්තරම නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) කාර්යාලයේ අලෙවි සැල තුල මුදල් අයථා ලෙස පරිහරණය කර ඇති බවට අනාවරණය වී වසරකට අධික කාලයක් ගත වී ඇතත්, ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ වන විට පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 177 (1) | 1,509,218 | බිඳුණුවැව මී මැසි සංවර්ධන ඒකකය විසින් අවස්ථා 29 ක් දෛනිකව එකතුවන ආදායම් දින 04 සිට දින 20 දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව බැංකුගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට අධ්‍යක්ෂවරු දැනුවත් කළ බව. | රෙගුලාසි ප්‍රකාරව ආදායම් බැංකුගත කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| **(ඇ)** 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකළ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති | | | | |
| I වැනි කාණ්ඩයේ XVIII වන පරිච්ඡේදයේ 244 රීතිය | - | ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ නිලධාරීන් 34 දෙනෙකු සහ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන් 547 දෙනෙකු ස්ථානමාරු වීම් නොලබා වර්ෂ 05 වර්ෂ 31 ක් අතර කාල පරාසයක එකම සේවා ස්ථානයක සේවයේ යොදවා ගෙන තිබුණි. | වසර 05 කට වැඩියෙන් සේවය කරන නිලධාරින්ගේ ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීති අනුව කටයුතු කළ යුතුය. |

## 2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බැංකු ගිණුම් 03 කට අදාළව වලංගු කාලය ඉක්මවූ එකතුව රු.2,965,402 ක චෙක්පත් 61 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම චෙක්පත් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | චෙක්පත් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වවුනියාව සහ කරදියනාරු සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) කාර්යාල වල 2023 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ලැබීම් රු. 736,462,632 ක සහ හඳුනා නොගත් ගෙවීම් රු. 737, 993,227 ක ශේෂයන්ට අදාළ උප ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | මේ පිළිබඳව සොයා බලා විධිමත් කිරීමට කටයුතු කරන බව. | බැංකු සැසඳුම්වල එක් එක් ශේෂයන්ට අදාල උප ලේඛන ඉදිරිපත් කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොලොන්නරුව රජයේ බීජ නිෂ්පාදන ගොවිපල පසුගිය කන්න 06 ක් තුල රු.5,226,734 ක් වැය කර අතිරේක ආහාර බෝග කි.ග්‍රෑම් 33,562 ක නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද ඉන් කි.ග්‍රෑම් 5,979 ක් පමණක් නිෂ්පාදනය කිරීමට හැකි වී තිබුණි. එය අපේක්ෂිත නිෂ්පාදනයෙන් සියයට 18 ක් විය. | ඉදිරියේදී ගැටළු මගහරවා ගනිමින් අපේක්ෂිත ඉලක්කයන් ළඟා කර ගැනීමට කටයුතු කරන බව. | අදාල ඉලක්කගත බීජ නිෂ්පාදනය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගන්නෝරුව එළවළු බීජ මධ්‍යස්ථානයට ලැබී තිබූ එලවළු බීජ පිළිබඳ සිදුකළ නියැදි පරීක්ෂාවේදී, පසුගිය කන්න 04 ක ලැබී තිබුණු බීජ කි.ග්‍රෑ. 5413 කින් බීජ කි.ග්‍රෑ. 2894 ක් පැලවීම දුර්වල බීජ ලෙස ඉවත් කර තිබුණි. | බීජ පැළවීම දුර්වල වීමට හේතු රාශියක් බලපාන බවත්, ප්‍රරෝහන ප්‍රතිශතය කාලයත් සමග අඩුවන බවත්. | අදාල ඉලක්කගත බීජ නිෂ්පාදනය ලබා නොගැනීමට හේතු වූ සාධක අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පිදුරුතලාගල රජයේ බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපලේ පසුගිය කන්න තුනක් තුල රු.26,659,785 ක් වැයකර බීජ අර්තාපල් කි.ග්‍රෑ. 247,500 ක් නිෂ්පාදනය කිරීමට සැළසුම් කර තිබුණද, ඉන් කි.ග්‍රෑ. 97,638 ක් පමණක් නිෂ්පාදනය කිරීමට හැකි වී තිබුණි. එය අපේක්ෂිත නිෂ්පාදනයෙන් සියයට 39 ක් තරම් අඩු මට්ටමක් විය. | විවිධ හේතු මත ඇස්තමේන්තුගත අස්වැන්න අඩුවන බවත්, සියයට සියයකින් බීජ අර්තාපල් නිෂ්පාදනය ප්‍රායෝගික නොවන බවත්. | අදාල ඉලක්කගත බීජ නිෂ්පාදනය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුල විධිමත් තාක්ෂණික ඇගයිමකින් තොරව රු. 93,518,508 ක් වැයකර නුවරඑළිය බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපල 05 ක ඉදිකර තිබුණු විදුලි වැටවල් 05 ක් අතුරින් රු. 67,245,266 ක විදුලි වැටවල් 03 ක් වර්ෂ 1 ක සිට වර්ෂ 07 ක් අතර කාල පරාසයක් තුල සක්‍රීයව භාවිතයට නොගෙන අත්හැර දමා තිබුණි. | ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැතිවිම හේතුවෙන් නඩත්තු කළ නොහැකි බව. | අධික පිරිවැයක් වැය වන ව්‍යාපෘති විධිමත් ඇගයීමක් මත සිදුකළ යුතුය. |

**3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පසුගිය වසර 08 ක කාලය තුල රු. 337,170,792 ක් වැය කර ලොකු ළූණු බීජ නිෂ්පාදන ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කර තිබුනද, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දත්තයන්ට අනුව 2014 වර්ෂයේ මෙ.ටො. 98900 ක් වූ දේශීය ලොකු ළූණු බීජ නිෂ්පාදනය 2022 වර්ෂය වන විට මෙ.ටො. 15840 ක් දක්වා මෙ.ටො. 83,060 කින් හෙවත් සියයට 84 ක ප්‍රමාණයකින් පහළ ගොස් තිබුණි. | වගාවට යොමුවන ගොවීන් පිරිස අඩුවීමත්, සමස්ත වගා බිම් ප්‍රමාණය අඩුවීමත්, මත සමස්ත ලොකු ළූණු වගා අස්වැන්න පසුගිය වසර දහයක කාලය තුළ සැලකිය යුතු මට්ටමකින් පහළ ගොස් ඇති බව. | නිවැරදි අධ්‍යයනයකින් පසු ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.4 විදේශ ආධාර ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ ලොකු ළූණු බීජ නිෂ්පාදනය හා වගා තාක්ෂණික ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ වසර 05 ක කාලය තුල KOPIA ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම් 05ක් සඳහා රු. මිලියන 203.9 ක් වියදම් කර ඇතත්, නියැදි පරීක්ෂණයට අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අසාර්ථක වී තිබුණි. | කාලගුණික හේතු, ආර්ථික ප්‍රතිපත්ති, ආකල්පමය හේතු, කොවිඩ් තත්ත්වය, ආදී විවිධ කරුණු නිසා වගාවන් සඳහා ගොවීන් යොමු නොවීම හේතුවී ඇති බව. | නිවැරදි අධ්‍යයනයකින් පසු ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොළොන්නරුව නියෝජ්‍ය අධ්‍යක්ෂ (බීජ) කාර්යාලයට අනුමත රු. 800,000 ක ප්‍රසම්පාදන සීමාව තුල කටයුතු කිරීමේ පරමාර්ථයෙන්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියට අනුකූල නොවන පරිදි කොටස් කර අවස්ථා 06 කදී රු.11,659,563 ක ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දැක්ම මෙහෙවර අරමුණ උදෙසා මෙලෙස කටයුතු කර ඇති බවත්, ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ වගන්ති ප්‍රකාරව කටයුතු කරන බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

## 3.6 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාප්ති හා පුහුණු අංශය මගින් ක්‍රියාත්මක කර තිබූ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ව්‍යාපෘතිය (GAP) හා මොණරාගල තෙළුල්ල එළවළු පළතුරු සැපයුම් මධ්‍යස්ථානයේ භාවිතය සඳහා 2016,2020,2021 සහ 2022 වර්ෂ වලදී රු. 4,145,559 ක් වැය කර මිලදී ගෙන තිබූ භාණ්ඩ වර්ග 22 ක් අදාළ අරමුණුගත කාර්යයන් සඳහා ලබා නොදී සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගන්නොරුව කෘෂි ව්‍යාපාර සංවර්ධන ඒකකයේ නිෂ්කාර්යයව ගබඩා කර තිබුණි. | ඉදිරියේදි ඇසුරුම් මධ්‍යස්ථාන වලට ලබාදීමට කටයුතු කරන බව | භාණ්ඩ අරමුණුගත කාර්යයට යෙදවිය යුතුය. |
| (ආ) | පොළොන්නරුව නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) කාර්යාලයේ යාන්ත්‍රික අංශයේ විදුලි පරිපථය ස්ථාපනය කිරීම වෙනුවෙන් 2021 දෙසැම්බර් මිලදි ගෙන තිබූ පිරිවැය රු.486,576 ක් වූ උපකරණ අදාළ කාර්යයන් සඳහා භාවිතා නොකර වසර 02 ක කාලයක් කාර්යාල ගබඩාවේ නිෂ්කාර්යව ගබඩා කර තිබුණි. | විදුලි පරිපථය කඩිනමින් භාවිතා කිරිමට කටයුතු කරන බව | භාණ්ඩ අරමුණුගත කාර්යයට යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පිදුරුතලාගල රජයේ බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපලේ 2012 වර්ෂයේදී ඉදි කර තිබූ විදුලි වැට සඳහා අතිරේඛ කම්බි පොටවල් 02 ක් සවි කිරීම වෙනුවෙන් **2014** වර්ශයේ මිලදීගෙන තිබූ රු.941,750 ක ද්‍රව්‍ය භාවිතයට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි. | පවතින කම්කරු හිගය නිසා භාවිතා කිරිමට නොහැකි වූ බව | අරමුණුගත කාර්යයන් ඉටු වන පරිදි මිලදී ගැනීම් සිදු කළ යුතුය. |

## 3.7 පාඩු හා හානි

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය (සටහන (i) ) අනුව මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ කටයුතු අවසන් නොකළ 1976 වර්ෂයේ සිට පවතින ඇස්තමේන්තුගත වටිනාකම රු. 106,934,291 ක් වූ පාඩු හා හානි සිද්ධි 437 ක් දක්වා තිබූණි. සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව මු.රෙ 104 (3) පරීක්ෂණවල දීර්ඝකාලීන ප්‍රමාදය හේතුවෙන් ක්‍රියාමාර්ගයන් අනුගමනය නොකළ එකතුව රු.47,938,490 ක සිද්ධි 02 ක් හා වටිනාකම හඳුනා නොගත් සිද්ධි 11 ක් පාඩු හා හානි ප්‍රකාශයට තුළ ඇතුලත් කර නොතිබුණි. | අදාළ ආයතනය සමග සම්බන්ධකරණය කර පරික්ෂණ කඩිනමින් කිරිමට කටයුතු කරන බව | රෙගුලාසි ප්‍රකාරව පාඩු හා හානි සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | ගන්නෝරුව එළවළු බීජ මධ්‍යස්ථානයේ 2013 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ වර්ෂ 10 ක කාලය තුල ප්‍රරෝහණ ප්‍රතිශතය දුර්වල වීම හේතුවෙන් | අලාභයන්ට අදාළ පරික්ෂණයන් පිළියෙළ කිරිම සඳහා විශේෂ කමිටුවක් පත්කර ඇති අතර අදාළ පාර්ශව අනුව ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් සිදුකරන බව | පාඩු හා හානි සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අසමත් වූ රු.44,332,526 ක් වටිනා එළවළු බීජ කි.ග්‍රෑ. 5699 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව කටයුතු කර පූර්ණ වාර්තාවන් ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ඇ) | මුදල් රෙගුලාසි 109 (1) ප්‍රකාරව පරීක්ෂණ කටයුතු අවසන් වූ රු. 13,188,887 ක අලාභ හානි සම්බන්ධව මු.රෙ. 108 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට යවා ඇති බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව පාඩු හා හානි සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කළ යුතුය. |

**3.8 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අම්බලන්තොට රජයේ බීජ නිෂ්පාදන ගොවිපල තුල වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සඳහා වැඩ බිමට ද්‍රව්‍ය හා කම්කරු ශ්‍රමය සපයා නොතිබියදි ඒ සඳහා රු.346,850 ක් ගෙවීම් කර තිබුණි. | මේ වන විට ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති බව | කරන ලද සැපයුම සඳහා පමනක් ගෙවීම් කල යුතුය. |
| (ආ) | අම්බලන්තොට රජයේ බීජ නිෂ්පාදන ගොවිපලට අයත් සංචාරක බංගලාවේ වහලය අළුත්වැඩියාව සඳහා සමාලෝචිත වර්ෂය තුල මිලදි ගෙන තිබූ රු.1,021,376 ක ද්‍රව්‍ය භාවිතා නොකර තිබියදී නිකුත් කිරීම් ලෙස ගබඩා ලේඛනවල සටහන් යොදා තිබුණි. | ඉතිරි සියළු භාණ්ඩ තොග පොත්වලට ගෙන ඇති බව | විධිමත් අනුමැතියක් මත විනිවිදභාවයෙන් යුතුව කටයුතු කළ යුතු අතර, ආයතන සංග්‍රහය ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | අම්බලන්තොට රජයේ බීජ නිෂ්පාදන ගොවිපල පරිශ්‍රයේ ආලෝකකරණය සඳහා රු.690,140 ක සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන වීදි ලාම්පු 10 ක් ඉදිකර නොතිබියදී, අදාළ ඉදිකිරීම් | මේ වන විට සියළුම සවිකිරීම් අවසන් කොට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින බව | විධිමත් අනුමැතියක් මත විනිවිදභාවයෙන් යුතුව කටයුතු කළ යුතු අතර, ආයතන සංග්‍රහය ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සිදුකළ බවත්, ඒවා නිවැරදි බවත්, අපේක්ෂිත තත්ත්වයෙන් යුක්ත බවත්, ගොවිපල් කළමනාකරු හා බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ යාන්ත්‍රික ඉංජිනේරු යන අය විසින් සටහන් යොදා ගෙවීම් වවුචර්පත් 2023 දෙසැම්බර් 31 දින ඉදිරිපත් කර තිබුණි. | | |
| (ඇ) | අම්බලන්තොට රජයේ බීජ නිෂ්පාදන ගොවිපලේ අංක 02 බීජ සැකසුම් ඒකකය සඳහා රෝලර් දොරක් සවි කිරීම වෙනුවෙන් 2023 දෙසැම්බර් 29 දින රු. 324,425 ක මුදලක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා ඇතත්, 2024 ජනවාරි 18 දින වන විටත් අදාළ රෝලර් දොර ගොවිපල වෙත සපයා හෝ සවිකර නොතිබුණි. | මේ වන විට සියළුම සවිකිරීම් අවසන් කොට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින බව | විධිමත් අනුමැතියක් මත විනිවිදභාවයෙන් යුතුව කටයුතු කළ යුතු අතර, ආයතන සංග්‍රහය ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | බෝඹුවල වී පර්යේෂණ ආයතනයේ කටයුතු සඳහා මිලදී ගෙන තිබූ සිමෙන්ති මිටි 32 ක් ආයතනයේ කටයුතු සඳහා නිකුත් කළ බවට සටහන් යොදා ආයතනයේ සේවයේ නියුතු නිලධාරීන් දෙදෙනෙකු විසින් පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලබා ගෙන තිබුණි. | මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදුකෙරමින් පවතින බව. | නිලධාරීන් සම්බන්දයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.9 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වී, එළවළු හා අතිරේක ආහාර බෝග ඇතුළුව බෝග වර්ග **30** ක් සඳහා නිෂ්පාදනය සිදු කරන වපසරිය මත පදනම්ව සෑම සති **02** කට වරක් නිකුත් කරන බෝග පුරෝකථන වාර්තා හා පූර්ව | දත්ත වල නිවැරදිතාවය ඉහළ නැංවීම සඳහා නව ක්‍රමයක් හඳුන්වාදිය යුතුව පවතින බව | ජාතික වගකීමක් සහිත ක්ෂේත්‍රයන් පිළිබඳ වැඩි අවධානයකින් ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිවේදන වෙනුවෙන් භාවිතා කරන ප්‍රාථමික දත්ත ලබා ගැනීමේ මූලාශ්‍ර හා ක්‍රමවේදයේ පවතින අක්‍රමවත්බව අවිධිමත්බව හා අධීක්ෂණයේ දුර්වලතා හේතුවෙන් අදාළ පුරෝකථන වාර්තා හා පූර්ව නිවේදනවල නිවැරදිතාවය විගණනයේදී ගැටළු සහගත විය. | | |
| (ආ) | මු.රෙ. 751 හා 753 වගන්තිවලට අනුකූලව එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් 2019 නොවැම්බර් හා දෙසැම්බර් මාසවල ලබා දී තිබුණු රු.15,200,000 ක ජංගම දුරකතන 400 ක් ගබඩා ලේඛනවල සටහන් නොකර බෙදා හැරීමට කටයුතු කර තිබුණි. | ඉදිරියේදී ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව නිලධාරින් දැනුවත් කර ඇති බව | මු.රෙ. 751 හා 753 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගන්නෝරුව එළවළු බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකවරයාගේ අනුමැතිය මත 2011 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ අවස්ථා 41 කදී එකතුව රු.5,826,554 ක බීජ කිලෝග්‍රෑම් 1867 ක් විවිධ රජයේ ආයතන වෙත සති 02 ක ගෙවීම් කාලයක් සහිතව ණය පදනම මත නිකුත් කර වර්ශ 1 ක සිට වර්ශ 12 ක් අතර කාල පරාසයක් ගත වී ඇතත්, මෙම ණය මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලැබුනු පසු නිරවුල් කිරීමට කටයුතු කරන බව | ණයගැති ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කළ යුතුය. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව තිරසාර සංවර්ධන අරමුණු හා ඊට අදාළ දර්ශක 03 ක් හදුනාගෙන තිබුණද 2030 වර්ෂය වන විට අදාළ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඊට අදාළව පිළියෙළ කර තිබුණු සංවර්ධන සැලැස්ම හෝ හදුනාගත් දර්ශක වල ප්‍රගතිය විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2023 යල කන්නයේ ආදායම් වියදම් ප්‍රකාශනවල ගණනය කිරීම අවසන් වූ පසු ප්‍රගතිය පිළිබඳ විස්තර ලබා දෙන බව | තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට අදාළ මූලික සැලැස්ම හා ඊට අදාළ ප්‍රගතිය වාර්ෂිකව මැන බැලිය යුතුය. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය සමග සැසඳීමේදී, තනතුරු 2795 ක පුරප්පාඩු පැවතුණි.එම පුරප්පාඩු තුලට ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගේ තනතුරු 696 ක් හා තාක්ෂණ සේවයේ තනතුරු 557 ක පුරප්පාඩු ඇතුලත් විය. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව | අවශ්‍යතාවය හදුනාගෙන පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කෘෂිකර්ම උපදේශකවරුන් 425 ක ඌනතාවයක් පවතිද්දී, බිඳුණුවැව මී මැසි සංවර්ධන මධ්‍යස්ථානය සඳහා ප්‍රමානවත් කාර්යය පැවරුමක් රහිතව කෘෂිකර්ම උපදේශකවරු 06 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. | අනුමත සේවක සංඛ්‍යාව අනුව නිලධාරීන් අනුයුක්ත කර ඇති බව හා ඔවුන් සඳහා රාජකාරි ලැයිස්තු ලබා දී ඇති බව | සීමිත මානව සම්පත විධිමත්ව කළමනාකරණය කළ යුතුය. |